පූජ්‍ය. ඉලුක්කේවෙල ධම්මරතන හිමි (ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, දර්ශනපති),
කථිකාචාර්ය,
බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

# අරූපරාග සංයෝජනය

නිර්වාණගාමී මාර්ගය අනුගමනය කරන යෝගවචරයා රූපාරාග සංයෝජන බිඳදමා අරූපරාග සංයෝජන බිඳදැමීම සඳහා අනුගමය කරනු ලබන ප්‍රතිපදාවන් පිළිබඳව ත්‍රිපිටකාගත මෙන් ම පශ්චාත් පෙටක ග්‍රන්ථාගතව ද කරුණු දක්වෙයි.

සෝතාපත්ති මග්ග සිත පහළවීමත් සමග සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන මූලික සංයෝජන තුන ප්‍රහීණ වෙයි. කාමරාග හා ව්‍යාපාද යන සංයෝජනයන්ගේ බලය අඩක් සිඳීමෙන් සකදාගාමි සිත ද එම සංයෝජනයන් දෙක සමූල වශයෙන් ප්‍රහීණ කිරීමෙන් අනාගාමී සිත ද උපදවාගත හැකිය. ඒ අනුව ඔරම්භාගිය සංයෝජන පහ සම්පූර්ණයෙන් ප්‍රහීණ කිරීමෙන් අනාගාමී සිත උපදාවාගත හැකිය. උද්ධම්භාගිය වශයෙන් සඳහන් කෙරෙන සංයෝජන පහ ප්‍රහීණ කිරීමෙන් අරහත් සිත උපදවාගත හැකිය. මෙය අභිධර්මිකයක් විසින් නිවන් මග පැහැදිලි කරදීම සඳහා යොදා ගන්නා වඩා විධිමත් වූ පිළිවෙළ යි.

අරූපාරාග සංයෝජනයට දස සංයෝජන අතර හිමිවන්නේ හත්වන ස්ථානය යි. ඔරම්භාගිය සහ උද්ධම්භාගිය වශයෙන් මෙම සංයෝජනයෝ දෙකොටසකි.[1] ඒ අනුව උද්ධම්භාගිය යටතට අයත් වන දෙවන සංයෝජනය මෙම අරූපරාග සංයෝජය යි.[2] ආකාසානඤ්චායතනාදී සමවත් මගින් ලබන සුවය පිළිබඳ ඇල්ම අරූපරාග යයි. එහි ඇල්ම ඇති නොකොට ගෙන භාවනා වඩන යෝගාවචරයාහට අරහත් ඵලය උපදාවගැනීමට හැකි වේ.

මෙම සංයෝජන අතුරෙන් උද්ධම්භාගිය සංයෝජනයන්ගේ ප්‍රහාණය සඳහා අනුගමනය කළ හැකි පියවර කිහිපයක් පෙළ දහමෙන් හමු වේ.

1. සතර සතිපට්ඨානය වැඩීම[3]
2. සතර සම්මප්ධාන වැඩීම[4]
3. සතර ඉද්ධිපාද වැඩීම[5]
4. පඤ්ච ඉන්ද්‍රියන් වැඩීම[6]
5. පඤ්ච බල වැඩීම[7]
6. සප්ත බොජ්ඣංග වැඩීම[8]
7. ආර්ය අෂ්ඨාංගික මාර්ගය වැඩීම[9]

උක්ත ප්‍රතිපදාවන් සූත්‍රපිටකයේ විවිධ සූත්‍රයන්හි දක්වා ඇතත් එක් සූත්‍රයකදී මෙම කරුණු සියල්ල දක්වා නොමැති බව පැහැදිලිය. නමුත් මෙම කරුණු හත සප්තිස් බෝධිපාක්ෂික ධර්ම වන හෙයින් ඒ පිළිබඳ මහාපරිනිබ්බාන, සාමගාම වැනි සූත්‍රවල දක්වා ඇත. විශේෂයෙන් ම මහාපරිනිබ්බාන සූත්‍රයේ දී යම්තාක් භික්ෂූහු සප්තිස්-බෝධිපාක්ෂික-ධර්ම වඩත් ද ඒතාක් මේ ශාසනය රහතුන්ගෙන් හිස් නොවන බව දක්වා ඇත.

චිත්ත කාණ්ඩයට අයත් සිත් 89 අතුරින් සිත් 12 ක් අරූපාවචර භූමියට අයත් වේ. නැවත එම සිත් කුශල, විපාක හා ක්‍රියා වශයෙන් තුන් ආකාර හෙයින් එක් කාණ්ඩයකට අයත් සිත් සංඛ්‍යාව හතරකි.

1. ආකාසානඤ්චායතන සිත
2. විඤ්ඤාණඤ්චායතන සිත

3. ආකිඤ්චඤ්ඤායතන සිත
4. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත[10]

**ආකාසානඤ්චායතනය**

සතර බ්‍රහ්ම විහාරයනට අනතුරුව සතර අරූප ධ්‍යානයන් අතුරෙන් පළමුවන ආකාසානඤ්චායතන ධ්‍යානය වඩනු කැමති යෝගාවචර තෙමේට මෙසේ සිත් වේ.

> ''රූපය හේතුකොට ගෙන මෙරමා පෙළීම පිණිස දඬු-මුගුරු ගැනීම ද, කඩු-දුනු ආදී ආයුධ ගැනීම ද, ඔවුනොවුන් හා කරන කලහ විග්ගහ විවාදයෝ ද, පැනෙත් ම ය. ඒ සියල්ල සර්වප්‍රකාරයෙන් අරූපී භවයේ නැතැයි ද, මෙසේ නුවණින් සලකා ඉෂ්ටානිෂ්ට සියලු රූපයන්ගේ ම කලකිරීම පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස පිළිපන්නේ වෙයි.''[11]

රූපය ඉක්මවා ලබා ගන්නා අරූපාවචර ධ්‍යානය **සන්ත විමොක්ඛ** නම් වේ. රූපාවචර චතුර්ථධ්‍යානයයෙහි (සූත්‍ර පිටකයට අනුව) ආදීනව දකින යෝගී තෙමේ ආකාසානඤ්චායතන ධ්‍යානය ශාන්ත වශයෙන් ද, අනන්ත වශයෙන් ද, මෙනෙහි කොට සක්වල අවසන් කොට හෝ කසිණාලෝකය පතුරුවා එයින් 'අහස-අහස' යැයි කියා හෝ 'අනන්තාකාස' යැයි කියා හෝ ඒ කසිණාලෝකය උගුළුව යි.[12] මෙසේ කටයුතු කරන එම යෝගාවචරයා ආකාසානඤ්චායතන ධ්‍යාන චිත්තය උපදාවගනී. විශුද්ධි මාර්ගය ඒ බව උපමාවකින් මෙසේ පැහැදිලි කරයි.

> ''මෙසේ අරූපාවචර ධ්‍යානය උපන් කල්හි මුදුනෙහි පටන් වැසූ සිවිකාදී යානයෙක හෝ කුඩා දොරටුවෙක හෝ කළයෙක හෝ මුඛයක් නිල්, රන්වන්, රතු, සුදු, ඇ පැහැ ඇති එක්තරා රෙදි කැබැල්ලකින් බැඳ බලන පුරුෂයෙක් වාත වේගයෙන් හෝ වෙනයම් කිසිවකින් පහව ගිය කලැ අහස මැ බලමින් යම්සේ සිටී ද? එසේ ඒ යෝගී තෙමේ පෙර නීල-පීතාදී යම්කිසි කසිණයකින් උපදවා ගත් කසිණ මණ්ඩලය උපචාර ධ්‍යාන නැමැති ඇසින් බලමින් සිට ''ආකාස කසිණ යැ'' ''ආකාස යැ'' යන මේ පරිකර්ම මනස්කාරයෙන් වහා ඒ කසිණ නිමිත්ත පහව ගිය කල්හි අරූපාවචර ධ්‍යාන නැමැති ඇසින් බලමින් වාසය කෙරේ.''[13]

අකාසානඤ්චායතන ධ්‍යානය උපදවාගත් යෝගාවචර තෙමේ රූප සංඥාව ඇත යනාර්ථයෙන් විවිධ සංඥා වශයෙන් මෙනෙහි නොකොට ආකාශය අනන්ත යැයි ආකාසානඤ්චායතනය වඩමින් කටයුතු කරයි.[14]

**විඤ්ඤාණඤ්චායතනය**

ආවජ්ජනා දී යන පඤ්චවිධ වශීතාවයෙන් ආකාසානඤ්චායන සමාපත්තිය පුරුදු කරන යෝගාවචරයා ඉන්පසු ආකාසානඤ්චායතනයෙහි ආදීනව දුන ඒ පිළිබඳ ඇති කැමැත්ත අතහැර විඤ්ඤානඤ්චායතනය මනාව මෙනෙහි කරයි. **'විඤ්ඤාණය අනන්ත'** යැයි කියා හෝ **'විඤ්ඤාණය විඤ්ඤාණය'** යැයි කියා හෝ මෙනෙහි කරයි.[15] එහි ප්‍රතිඵලයක් වශයෙන් විඤ්ඤාණඤ්චායතන ධ්‍යාන සිත යෝගියා විසින් උපදවා ගනී.

**ආකිඤ්චඤ්ඤායතනය**

විඤ්ඤාණඤ්චායතනය ආවජ්ජනා දී පස් අයුරකින් වඩන යෝගී තෙම එහි ආදීනව දකී. ඉන්පසු ආකිඤ්චඤ්ඤායතන නම් වූ ධ්‍යායට සමවැදීම සඳහා විඤ්ඤාණයාගේ අභාවය, ශූන්‍යත්වය මෙනෙහි කරයි. එසේ නැවත නැවත සිහිකරන යෝගියාගේ සිතෙහි නීවරණයෝ පහවෙති. සිහිය පිහිටයි. උපචාර වශයෙන් සිත සමාධිගත වෙයි. ඒ අනුව විඤ්ඤාණඤ්චායතනයාගේ ශූන්‍ය භාව සංඛ්‍යාත අරමුණෙහි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත පිහිටයි.[16]

මේ සඳහා උපමාවක් විශුද්ධි මාර්ගයෙහි එයි. යම් කිසි පුද්ගලයෙක් ධර්ම ශාලාවෙහි රැස්ව හුන් භික්ෂූන් වහන්සේ දැක කිසියම් කටයුතුතක් සඳහා බැහැර වෙයි. නැවත ඔහු පැමිණි විට එම භික්ෂූන් තමන් පැමිණි කාරණය නිමවා ආපසු පිටව ගොස් ඇති බව දකී. මෙහි දී මෙම පුද්ගලයා දකින්නේ හිස වූ ශාලාව පමණි. සිදු වූ කිසිවක් පිළිබඳ ඔහු දැන නොගනී.[17] එමෙන් ම භාවනා වශයෙන් '**නත්‍ථි නත්‍ථි**' යැයි මෙනෙහි කිරීමෙන් ඒ විඤ්ඤාණය පහව ගිය විට ඒ පහවීම ම බලමින් සිටී. එය කුමකින් පහවගියේ දැයි හෝ කොතැනකට ගියේ දැයි හෝ නොබලයි.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතනය**

ආවජ්ජනාදී පස් අයුරකින් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයෙහි වශී බවට පත් යෝගී තෙම එහි අදීනවය දැක නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය වඩනු කැමති වෙයි. නැවත නැවත ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ම '**ශාන්ත**' යැයි ප්‍රත්‍යවේක්ෂා කරන ඒ යෝගාවචරයාගේ සිත්හි නීවරණයෝ පහවෙති. උපචාරධ්‍යානයෙන් සිත එකඟ වේ. ඉන්පසු නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන සිත අර්පණා වශයෙන් මනාව උපදී. මෙතෙකින් ඒ යෝගාවචර තෙම 'ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සිත ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි'.[18]

මෙම නෙවසඤ්ඤානාසඤ්ඤා ධ්‍යානය පැහැදිලි කිරිම සඳහා විශුද්ධි මාර්ගය යොදා ගෙන ඇති උපමාව මෙසේය.

එක් සාමණේර හිමි නමක් විසින් පළමු දිනයේ දී පාත්‍රයෙහි තෙල් ගල්වා තැන්පත් කරන ලදි. පසුදා උදෑසන කැඳ වළඳන පිණිස තෙරුන්වහන්සේ පාත්‍රය රැගෙන එන ලෙස පැවසූ විට එහි තෙල් ඇති බව පැවසීය. තෙරුන්වහන්සේ තෙල් ඇත්නම් එය ගුලාවට වක්කරන ලෙස පැවසූහ. එවිට සාමණේර හිමි පැවසූයේ තෙල් නැති බවයි. මින් පැහැදිලි වන්නේ පාත්‍රයෙහි තෙල් ඇති බවත් එය ගුලාවෙහි වැක්කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බවත් ය. ඒ අනුව ඖදාරික සංඥා කෘත්‍ය කිරීමට අසමර්ථ හෙයින් නෙවසඤ්ඤා වුව ද, සංස්කාරාවශේෂ සූක්ෂම භාවයෙන් යුතු හෙයින් නාසඤ්ඤා නම් වන බව දත යුතුයි.[19]

ප්‍රථම අරූප ධ්‍යානයෙහි අභාවයෙන් දෙවන ධ්‍යානය ද ඉන්පසු එහි අභාවයෙන් තුන්වන ධ්‍යානය ද ලබා සිව්වනුව නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානයට යෝගවචරයා පැමිණේ. නමුත් සිව්වන අරූප ධ්‍යානය ශාන්ත වශයෙන් මෙනෙහි කළ ද ඉක්මවීමක් නැත. මෙය උපමාවකින් මෙසේ ය.

මහත් වූ රාජානුභාවයෙන් අසු පිට නැගී නුවර වීථියෙහි හැසිරෙන මහරජතුමා ඇත්දත් කැටයම් ශිල්පියෙකු දැක පැහැදී ප්‍රශංසා කොට තෑගි ද දෙයි. නමුත් රජතුමා රජ්‍ය අතහැර දමා ගොස් එවන් ශිල්පියෙකු වීමට අදහස් නොකරයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පිළිබඳව ද එසේ ම දතයුතු ය.[20]

අරූපධ්‍යානයෙහි ප්‍රතිඝ (පටිඝ) සංඥාව ප්‍රහීණ කළ හෙයින් අරූප සමාපත්ති ලාබීහු '**ආනෙඤ්ජාභි සංස්කාරයහ**' යි ද, '**ශාන්ත විමොක්ෂයහ**' යි ද කියති. මේ සඳහා නිදසුන් ලෙස අරූප ධ්‍යානයට සමවන් ආළාරකාලාම තෙමේ තමා ළඟින් ම ගමන් ගත් ගැල් නොදිටී ම, ශබ්දය නො ඇසීම හා ඉන් නොනැගිටීම පෙන්වා දිය හැකිය. මෙම ධ්‍යානයට සමවැදි විට ඔවුන්ගේ මෙනෙහි කිරීමක් නැති හෙයින් '**නානත්ත සඤ්ඤානං අමනසිකාරා**' යි දක්වා ඇත. නමුත් මෙම ධ්‍යානයට සමවැදී නොසිටින විට එම යෝගියාහට නානාත්ව සංඥා අතුරෙන් සිත් 27 ක් උපදින බව විශුද්ධි මාර්ගය පෙන්වා දෙයි.[21] එනම්:

1. කාමාවචර කුසල් සිත් 08
2. මනෝද්වාරා වජ්ජන සිත 01
3. අහේතුක කුසල විපාක සිත් 08
4. ලෝභ සිත් 08
5. මෝහ සිත් 02

අරූපාවචර කුශලය මනඃකර්මමය ය. එය භාවනාමය ය. අර්පණාප්‍රාප්ත ය. ආරම්මණ භේදයෙන් චතුර්විධ ය.[22] අරූපාවචර කුශලය ක්‍රමයෙන් වැඩීමෙන් අරූප භූමීන් හි උපදියි.[23] ඒ ඒ භූමියට නියම කරන ලද මහද්ගත කුශලය ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙක්හි තමා හා සමාන වූ විපාකය උපදව යි. සතර ආරූප්‍ය ප්‍රතිසන්ධීහු අනුව එම භූමීන් හි වයස්ප්‍රමාණය මෙසේ ය.

1. ආකාසනඤ්චායනූපගත දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්ප විසිදහසකි.
2. විඤ්ඤාණඤ්චායනූපගත දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්ප සතළිස්දහසකි.
3. ආකිඤ්චඤ්ඤායනූපගත දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්ප සැටදහසකි.
4. නෙවසඤ්ඤානාසඤ්ඤායනූපගත දෙවියන්ගේ ආයුඃප්‍රමාණය කල්ප සුවාසූදහසකි.[24]

එසේ ම අරූපාවචර ප්‍රතිසන්ධියට ප්‍රඥප්ති වූ කර්ම නිමිත්ත ම අරමුණු වේ.[25] අසංඥසත්වයන්හට ජීවිත නවක රූප කලාපය ම ප්‍රතිසන්ධිභාවයෙන් පිහිටයි. අරූපී සත්ත්වයෝ අරූපප්‍රතිසන්ධිකයෝ ය. සෙස්සෝ රූපාරූප ප්‍රතිසන්ධිකයෝ ය.[26] අරූපාවචර ධ්‍යානයෙන් උපදනා ප්‍රතිඝ සංඥාවන් නොමැති හෙයින් ප්‍රහාණයෙන් හා නො ඉපදවීමෙන් අභාවය සිද්ධ වේ.

ආකාශවර්ජිත කසිණයන් අතුරෙන් යම්කිසි කසිණයක් උගුළුවා ලැබූ ආකාශය අනන්ත වශයෙන් පරිකර්ම කරන්නාහට ප්‍රථමාරූප්‍යය උපදනේ ය. ඒ ප්‍රථමාරූප්‍ය විඥානය ම අනන්ත වශයෙන් භාවනා කරන්නාහට ද්විතීයාරූප්‍යධ්‍යානය උපදනේ ය. ප්‍රථමාරූප්‍ය විඥානයාගේ අභාවය වනාහි **'නත්ථිකිඤ්චි'** යි පරිකර්ම කරන්නාහට තෘතීයාරූප්‍යය උපදී. තෘතීයාරූප්‍ය විඥානය 'මෙය ශාන්තය මෙය ප්‍රණීතය' යි භාවනා කරන්නාහට චතුර්ථාරූප්‍යය උපදී.[27]

මෙසේ රූපධ්‍යානලාභී ඒ යෝගී තෙම ඉනික්බිතිව ඒ ප්‍රතිභාග නිමිත්ත නම් වූ කසිණ රූපය කෙරෙහි පැවති රූප සංඥාව සර්වප්‍රකාරයෙන් ඉක්මවා ප්‍රතිඝ සංඥාව දුරු කොට නානාත්ව සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ඒ කසිණ මණ්ඩලයෙහි පැවති ආකාශය අරමුණු කොටගෙන **'අනන්තො ආකාසො'** යි අනන්තාකාශය ම මෙනෙහි කරමින් භාවනා කරනුයේ ආකාසානඤ්චායතන නම් වූ පළමුවන අරූපද්ධ්‍යානය ද, ඒ අනන්තාකාශය ම මෙනෙහි කරමින් භාවනා කරනුයේ ආකාසානඤ්චායතන නම් වූ පළමුවන අරූපද්ධ්‍යානය ද, ඒ අනන්තාකාශ නිමිත්ත ද හැරපියා එහි පැවති විඥානය අරමුණු කොට **'අනන්ත විඤ්ඤාණං'** යි අනන්ත විඥාන යයි ම මෙනෙහි කරමින් භාවනා කරනුයේ විඤ්ඤාණඤ්චායතන නම් වූ දෙවන අරූපද්ධ්‍යානය ද, ඒ ධ්‍යාන දෙකෙහිම අරමුණු වූ ආකාශ විඥාන දෙදෙනාගේ කිසිවක් නැත යන්න අරමුණු කොට ගෙන **'නත්ථි කිඤ්චි'** යි මෙනෙහි කරමින් භාවනා කරනුයේ ආකිඤ්චඤ්ඤායතන නම් වූ තෙවන අරූපද්ධ්‍යානය ද එහි පැවති ඖදාරික නුවූත් සූක්‍ෂම වූත් විඥානය අරමුණු කොට ගෙන භාවනා කරනුයේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන නම් වූ සතර වන අරූපද්ධ්‍යානය ද පිළිවෙළින් අධිගම කරන්නේ ය.

මෙසේ අරූපද්ධ්‍යාන ලාභිවූ ඒ යෝගී තෙම මත්තෙහි නාම රූප ධර්මයන්ගේ යථාභූත ඥානදර්ශනය වූ දෘෂ්ටි විශුද්ධිය සපයනු සඳහා තමා ප්‍රතිලබ්ධ වූ ඒ විදර්ශනාපාදක චතුර්ත්ථාද්ධ්‍යානයෙන් නැගිට ඒ ධ්‍යාන සහජාත විතර්කාදී ධ්‍යානාංග හා තත්සම්ප්‍රයුක්ත ධර්මයන් ද ලක්‍ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන විසින් මනා ව විමසා දැන මේ සියලු චිත්ත චෛතසික ධර්මයෝ 'අරමුණ කරා නැමෙන හෙයින් නාම ධර්ම වෙති' යි වෙන්කොට, මේ නාම ධර්මය වූ කලි කුමක් ඇසුරු කොට පවත්නේ දැයි විමසනුයේ ඊට නිශ්‍රය වූ හෘදය වස්තු රූපය දක්නේ ය.

ඒ වස්තු රූපය ද කුමක් නිසා පවත්නේ දැයි මත්තෙහි ද විමසනුයේ එයට නිශ්‍රය වූ සතර මහා භූත රූපයන් හා ඔවුන් ඇසුරු කොට පවත්නා සෙසු උපාදාය රූපයන් ද දක්නේ ය. මෙසේ මේ පංචස්කන්ධය නාම රූප පුඤ්ජ මාත්‍ර මුත් මෙහි සත්ත්ව පුද්ගලාදී විසින් පරමාර්ථ වශයෙන් ගතයුතු සාර බවෙක් නැත්තේ ම ය. මෙසේ දෘෂ්ටි විශුද්ධි, කඞ්ඛාවිතරණ විශුද්ධි, මාර්ගඥානදර්ශන විශුද්ධි, ප්‍රතිපදාඥානදර්ශන විශුද්ධි විසින් අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් ම දක්නේ තදනන්තර ව ඥානදර්ශන විශුද්ධි ප්‍රතිලාභයෙන් ශ්‍රොතාපත්‍යාදී සතර මාර්ග ඵලාධිගමයෙන් ලොකොත්තර ධ්‍යානය ද අධිගම කරන්නේ යි.[28]

අරූපාවචර ධ්‍යාන පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන කරුණ වන්නේ ඒ පිළිබඳ පෙල දහමෙහි දක්වා ඇත්තේ ඉතා අල්ප කරුණු බවයි. මේ පිළිබඳව අවධානය යොමු කළ විද්වතුන් අතර අයෙකි පූජ්‍ය ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි. උන්වහන්සේගේ අදහස මෙසේ ය.

> ''ආලාරකාලාම, උද්දකරාමපුත්ත යන ආචාර්යවරුන් ගෙන් ලද ඤාණ උපකාරී කරගෙන ඒ අනුව යමින් (ගෝතමයන් වහන්සේ) බුද්ධත්වයට පත් වූවා නම් බුදුරදුන් සම්මාසම්බුද්ධ වන්නේ නැත. එසේ ම ආළාරකාලාම හා උද්දකරාමපුත්ත යන තාපසවරු රූපාවචර ධ්‍යාන හෝ අරූපාවචර පළමු හා දෙවන ධ්‍යාන උපදවාගෙන සිටි බවක් සූත්‍රවල සඳහන් නොවේ. ඔවුන් මෙම ධ්‍යාන උපදවාගන්නට ඇත්තේ විවිධ යෝග අභ්‍යාසවල යෙදීමෙන් විය යුතු ය. ඔවුන් එම ධ්‍යාන උපදවාගෙන සිටියා නම් බෝසතාණන් වහන්සේට සතානුසාරී ඤාණයක් පහළ විය නොහැකිය. මෙම අරූපාවචර ධ්‍යාන පිළිබඳ ව එකල ශ්‍රමණ සම්ප්‍රදායයන් දැන සිටි බව සු.නි. පාරායන වග්ග උපසීව පඤ්හයේ දී උපසීව මානවකයාට ආකිඤ්චඤ්ඤායතනයෙන් කෙලෙස දුරු කිරීම පිළිබඳ දේශනා කිරීමෙන් ද පැහැදිලි වෙයි (සුත්ත නිපාත, පාරායන වග්ග, උපසීව පඤ්හ, 1977 බුජමු. 328 පිටුව. ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා - නත්ථීති නිස්සාය තරස්සු ඔඝං කාමෙ පහාය විරතො කථාහි - තණ්හක්ඛයං නත්තමහාභිපස්ස.). එහෙත් බුදුරදුන්ගේ ප්‍රශංසාවට ලක් වී ඇත්තේ රූපාවචර ධ්‍යාන බව පෙනේ. ආනන්ද තෙරුන් ගෝපක මොග්ගල්ලාන බමුණාට ප්‍රකාශ කරන්නේ ද බුදුරදුන් රූපාවචර ධ්‍යාන ප්‍රශංසා කරන බවයි (ම.නි. 3. ගොපකමොග්ගල්ලාන සූත්‍රය). අරූපාවචර ධ්‍යානවල ස්වභාවය විමසාබැලීමෙන් ද ඒවා ඍජුව නිවන ඉලක්ක කර නොමැති බව පෙනේ.''[29]

බුද්ධත්වය ලබාගැනීම සඳහා අරූපාවචර ධ්‍යාන උපයෝගී වූයේ දැයි ඇති වන ගැටලුවට පිළිතුරක් ලෙස ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමියෝ මෙසේ කරුණු දක්වති.

> ''... භාවනා වැඩූ බෝසතාණන් වහන්සේට පිළිවෙළින් පළමු, දෙවන, තෙවැනි හා සිව්වැනි ධ්‍යාන පහළ වූ අතර සිව්වැනි ධ්‍යානයෙන් පසු උන්වහන්සේගේ සිට ත්‍රිවිද්‍යාවේ පළමු ඤාණය වූ පුබ්බේනිවාසානුස්සතිය කෙරෙහි යොමු විය. ... මේ අනුව බුද්ධත්වය සඳහා අරූපාවචර ධ්‍යාන උපකාරී වී නැති බව පැහැදිලි වෙයි. ...''

කෙසේ වුව ද විවිධ අවස්ථාවලදී බුදුපරාණන් වහන්සේ විසින් දේශනා කරන ලද කරුණු අනුව නිවන සඳහා අරූපාවචර මුල් ධ්‍යාන තුන පමණක් උපකාරී වන බව ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමියන් පිළිගෙන ඇත.[30]

[1] අ.නි. 6, බු.ජ.ත්‍රි.මු. පිට. 32
දස ඉමානි භික්ඛවෙ සංයොජනානි, කතමානි දසඃ පඤ්චෙ ඔරම්භාගියානි සංයොජනානි, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි.

[2] අ.නි. 6, බු.ජ.ත්‍රි.මු. පිට. 32
කතමානි පඤ්චුද්ධම්භාගියානි සංයොජනානිඃ රූපරාගො, අරූපරාගො, මානො, උද්ධච්චං, අවිජ්ජා.

[3] ස.නි. 5 (1), බු.ජ.ත්‍රි.මු. පිට. 344 - උද්ධම්භාගිය සූත්‍රය
ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බා.

[4] ස.නි. 5 (1), බු.ජ.ත්‍රි.මු. පිට. 432 -
අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මාංන අනුප්පාදාය ... අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ... උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීයොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.

[5] S.N. v., PTS, 309 -ඡන්ද විරිය චිත්ත වීමංසා

[6] ස.නි. 5 (1), බු.ජ.ත්‍රි.මු. පිට. 424 -
පඤ්චින්ද්‍රියානි භාවෙතබ්බානි. සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං.

[7] ස.නි. 5 (1), බු.ජ.ත්‍රි.මු. පිට. 438 -
සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං භාවෙති. විවෙක නිස්සිතං, විරාගනිස්සිතං, නිරොධනිස්සිතං, වොස්සග්ගපරිණාමිං.

ස.නි. 5 (1), බු.ජ.ත්‍රි.මු. පිට. 442 -
සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං, පඤ්ඤාබලං භාවෙති. නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං.

[8] පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං අභිඤ්ඤාය පරිඤ්ඤාය පරික්ඛාය පහානාය සත්ත බොජ්ඣඞ්ගා භාවෙතබ්බා. සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා...

[9] ස.නි. 5 (1), බු.ජ.ත්‍රි.මු. පිට. 138 -
අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බා.

[10] අභිධර්මාර්ථ සංග්‍රහය, රේරුකානේ චන්දවිමල මහනාහිමි, ශ්‍රී චන්දවිමල ධර්මපුස්තක සංරක්‍ෂණ මණ්ඩලය, 2005, පිට. 19

[11] විස්ථාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ග, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004, පිට. 420./ ම.නි. මජ්ඣිමපණ්ණාසක 59 පිට.

[12] විස්ථාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ග, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004, පිට. 421.

[13] - එම.

[14] සබ්බ සො රූප සඤ්ඤානං සමතික්කමා පටිඝ සඤ්ඤානං අත්ථඞ්ගමා නානත්ත සඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති.

[15] විස්ථාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ග, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004, පිට. 428.

[16] - එම. පිට 430.

[17] - එම. පිට. 430.

[18] සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නේවසඤ්ඤා නාසඤ්ඤායතනං උපම්පජ්ජ විහරති.

[19] විස්ථාර්ථ සන්න සහිත විශුද්ධි මාර්ග, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004, 435.

[20] - එම. පිට. 433.

[21] - එම. පිට. 426.

[22] අභිධර්මාර්ථ සංග්‍රහය, රේරුකානේ චන්දවිමල මහනාහිමි, ශ්‍රී චන්දවිමල ධර්මපුස්තක සංරක්‍ෂණ මණ්ඩලය, 2005, පිට. 83

[23] - එම. පිට. 85

[24] - එම. පිට. 79

[25] - එම. පිට. 87

[26] - එම. පිට. 89

[27] - එම. පිට. 135

[28] ප්‍රස්ථාන මහා ප්‍රකරණ ගත සූවිසි ප්‍රත්‍යය ධර්ම විභාවිනිය, යූ.බී. රාජකරුණා, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ. 11, 1969, පිටු. 226-7

[29] ප්‍රඥා ප්‍රභාවිනී, ගෝනදෙණියේ පඤ්ඤාරතන හිමි, 2010,  පිටුව. 91

[30] - එම. පිට. 92